**නිකවැරටිය ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල හා ඊට පෙර වර්ෂවල සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබූ රු.7,629,470 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජ'නල් මගින් නිවැරදි කරන බව දන්වා සිටිමි. | ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල මෝටර් රථ හා කරත්ත තක්සේරු කර තිබූ අතර, එහිදී අගය වැඩිවීම් රු.1,496,500 ක් ගිණුම්ගත කර නොතිබූ අතර, අගය අඩුවීම්වල වටිනාකම රු.122,420 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි.ජ''නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි . | මෝටර් රථ තක්සේරු නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ශේෂය රු.1,541,750 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | විෂයයන් 02 කට අදාළව ආදායම් රු.2,478,891 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ජ'නල් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | වර්ෂය තුළ කපා හළ බදුකුලිය රු.1,663,787 ක් මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | ජ'නල් මගින් මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් 03 කට නඩු පවරා රු.612,600 වැයකර ඇතත්, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අතපසුවීමකින් බාහිර පාර්ශවයන්ට නඩු පැවරීම් මෙම වර්ෂයේ ගිණුම් වාර්තාවේ හෙළිදරව් කිරීමට නොහැකි විය. | අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 නොවැම්බර් 02 දිනැති අංක 2015/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | පුද්ගලයින්ගේ ඉල්ලීම මත සිදුකරන ආධාරවල උපරිමය රු.25,000 ක් විය යුතු වුවත්, ප්‍රාදේශීය සභා සභිකයකුගේ හදවත් සැත්කම සඳහා රු.500,000 ක මුදලක් ගෙවා තිබුණි. | ප්‍රාදේශීය සභාවේ සභික මහතෙකුගේ හෘද සැත්කමක් සඳහා සත්භාවයෙන් මෙම මුදල් ලබාදී ඇති අතර, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇත. | චක්‍රලේඛ විධිවිධානවල උපදෙස් අනුව කටයුතු කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,748,307 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,270,265 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය තුල සභාව සතු වත්කම් 04 ක් බදු දීමට කටයුතු නොකිරීමෙන් අවම ලංසුව මත රු.1,713,168 ක ආදායමක් අහිමි වී තිබුණි. | විගණන විසින් පෙන්වා දී ඇති මෙම වත්කම් 4 පස් වතාවක් විවෘත ටෙන්ඩර් කලද සුදුසු ගැනුම්කරුවන් ඉදිරිපත් නොවූ අතර ඊට පසුව ඇතිවූ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මාස 2 ½ ක් නිවසේ සිට රාජකාරී සිදුකිරීම නිසා ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදුකිරීමට අවස්ථාවක් නොලැබූ බවත් වාර්තා කරමි. | සුදුසු ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීමේ හේතුව සොයා බලා අවම ලංසුව සංශෝධනය කර ටෙන්ඩර් කැඳවීම සිදුකල යුතුවේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කාර්යය සාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොන්ක්‍රීට් නිෂ්පාදන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා 2020 අගෝස්තු 19 දින රු.7,736,609 ක් වැයකර තිබුණි. 2020 වර්ෂයේදී කොන්ක්‍රීට් නිෂ්පාදනයන් සිදුකර ආදායම් උපයාගෙන නොතිබුණු අතර 2021 වර්ෂයේදී රු. 192,770 ක ආදායමක් උපයා තිබුණි. | මේ වනවිට මාර්ගෝපදේශයක් සකස්කර ලබාදී ඇති බව වාර්තා කරමි. | මෙම ව්‍යාපෘතියෙන් කොන්ක්‍රීට් නිෂ්පාදනය සිදුකර ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුල සභාව සතු බස්නැවතුම්පල කඩ කාමර 05 ක් බදු දීමට කටයුතු කර නොතිබීමෙන් රු.420,000 ක ආදායමක් ද, සෞඛ්‍ය මධ්‍යස්ථානයේ බිම්මහල හා උඩුමහල කඩ කාමර 18 ක් බදු දීමට කටයුතු කර ඇතත් ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීම මත රු.1,434,000 ක ආදායමක්ද අහිමි වී තිබුණි. බස්නැවතුම්පල උඩුමහලේ කඩ කාමර විවෘත කර වසර 3 - 4 ක් පමණ ගතවී ඇතත්, විදුලිය නොමැති වීම, පරවියන් ලැගීම වැනි විවිධ හේතු මත වසා දමා ඇති බවත්, සභාව මෙම අඩුපාඩු සම්පූර්ණ කර දීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව වාර්තා කරමි. වාර්ෂිකව කුලී පදනම මත අදාල කඩ ලබාදීමට තීරණය කල නමුත් ගැනුම්කරුවන් ඉදිරිපත් වන්නේ නැත. | සභාව සතු වත්කම් බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැතියෝ, කර්මාන්ත අත්තිකාරම්, පෙර ගෙවුම් ශේෂ අයිතම 03 ක එකතු වටිනාකම රු.8,395,213ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව | ඉදිරියේ දී මෙම මුදල් නිරාකරණය කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව වාර්තා කරමි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.5,731,991 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.1,715,435 ක් වී තිබුණි. මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් ණයහිමියෝ, කර්මාන්ත ණයහිමියෝ ශේෂ 02 ක එකතු වටිනාකම රු.23,008,564ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.2,804,877ක් වූ අතර වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.1,682,650 ක් වී තිබුණි. මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගෙවිය යුතු මුදල් නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |